# සුභාෂිතය පවසන යහපත් පාලකයෙක් සතු ගුණාංග

**M. S. M. Mafaz**
Department of Languages, South Eastern University of Sri Lanka

mafazmsm@gmail.com

**පර්යේෂණ නිර්ණය :** *සුභාෂිතය, මහනුවර යුගයේ දී හිස්වැල්ලේ දහම්දප කවියාගේ පුතුවූ අලගියවන්න මුකවැටි පඬිතුමා විසින් රචනා කරන ලදී[1]. මෙහි සිව්පාද එක සීය එකක් පමණ ඇත. මෙම කව්වලින් පවසා ඇති අදහස් විදිමත් ආකාරයට පෙළගස්වා නොමෙතිවුවත් එහි ඇති අදහස් ශ්‍රෙෂ්ඨ ගණයේ අදහස් වේ. දෙමළ භාෂාවට අයත් මදූරෛ නම් පද්‍යය ග්‍රන්තයේ ඇති අදහස්වල බලපෑමට සුභාෂිතය ලක් වී ඇත.[2] මිනිසාගේ ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය ඔවදන් සුභාෂිතයේ තිබේ. සත් පුරුෂයෙක් සතුව ඇති සත් ගුණවත් ලක්ෂණයන් පිළිබඳ සුභාෂිතය මනහර ලෙස විග්‍රහ කර ඇත. එලෙසම අසත් පුරුෂයන්ගේ අයහපත් ගුණ ගැන විස්තර ද සුභාෂිතය පවසයි. රටක් පාලනය කරන රජෙකු හෝ පාලකයෙකු සතුව තිබිය යුතු ගති ගුණ ගැන ද සුභාෂිතය විස්තර සපයයි. එය පාලකයා සතුව අනිවාර්‍යයීයෙන්ම තිබිය යුතු සුදුසුකම් ලෙස සුභාෂිතය හගවයි. පාලකයා සතුව තිබිය යුතු ගුණාංගයන් පිළිබඳ විස්තර සුභාසිතයේ තැනින් තැන විසිරී පවති. රජෙකු සතුව තිබිය යුතු ගුණාංගයන් පිළිබඳ විස්තර සුභාෂිතයේ 18, 24, 25, 26, 27, 29, 30, 57, 68, හා 77 වැනි පදවල සෘජුවම තිබේ. මෙය හැර 19, 28, 46, 66, 85,  89, 94 ආදී පදවල ද පාලකයෙකු සතුව තිබිය යුතු ගුණයන් පිළිබඳ විස්තර වක්‍රව තිබේ. නමුත් මෙම පදවල "රජු" යන පදය හෝ ඊට සමානව ඇති පද උපයෝගී කොට ගෙන නැත. මේ පදවල පාලකයෙකු සතුව තිබිය යුතු ගුණාංග සත් පුරුෂයෙක් සතුව තිබිය යුතු ගුණාංග ලෙස හඳුන්වයි. මෙම ගුණාංග සත්පුරුෂයන්ට වඩා යහපත් පාලකයකුට අවශ්‍ය ගුණාංග බැවින් එම මාතෘකාව යටතේම මෙම ගුණයන් මෙම පර්යේෂණ යටතේ සාකච්ඡා කරනු ලැබේ. සුභාෂිතය පවසන යහපත් පාලකයකු සතුව තිබිය යුතු ගුණයන් පෙළගැස් වීම හා සුභාෂිතය ද රාජ්‍ය පාලනය පිළිබඳ න්‍යායන් හඳුන්වා දී ඇති බව තහවුරු කිරීම මෙම පයෙයීෂණයේ අරමුණු වේ. මෙම පර්යේෂණ පත්‍රිකාව යහපත් රජෙකු හො යහපත් පාලකයකු සතුව තිබිය යුතු යැයි සුභාෂිතය අදහස් කරන යහපත් ගුණ ධම් පිළිබඳව සාකච්ඡා කරයි.*

**ප්‍රමුඛපද :** සුභාෂිතය, යහපත් පාලනය, ගුණාංග

## 1. හැඳින්වීම

සමාජය පරිහානියට පත්වන අවස්ථාවේ දී එම සමාජය නගා සිටිවීම සඳහා අවශ්‍ය ඔවදන් ගැබ් කොට ගැන බොහෝ සාහිත්‍යය කෘති සෑම භාෂාවෙන්ම බිහි වී තිබේ. දෙමළ භාෂා සාහිත්‍යයේ ඇති සංගමරුවියම් යන යුගයේ දකුණු ඉන්දියානු දෙමළ ජනයා ගුණ ධම් අතින් පිරිහුණු යුගයක් ලෙස ඉතිහාසය හඳුන්වති. මෙම කාලවකවානුවේ දී බොහෝ යහ ගුණ පවසන තිරුක්කුරළ්, මණිමේකලෛ වැනි දෙමළ සාහිත්‍ය කෘතීන් බිහිවිය. එලෙසම නුවර යුගය යනු සිංහල ජනයා පරිහානියට පත්වෙමින් සිටි කාලවකවානුවක් විය. රටේ අභ්‍යන්තර දේශපාලන ඝට්ටන තිබුණු අතර පෘතුගීසිනගේ හා ලන්දේසීන්ගේ ආක්‍රමණාවලට නුවර රාජධානියට මුහුණ දීමට සිදුවිය. මෙහෙයින් දේශපාලන අස්ථාවර තත්වයක් මෙම රාජධානියේ තිබුණි. සමාජය ද පිරිහී තිබුණි. බොහෝ හිමිවරු සාසනය ද නොතකා සිව්රු අත්හැර ගියෝ ය. රජතුමා දරදඬු පාලකයෙක් විය. දෙවන රාජසිංහ රජතුමා සිය පසලොස් වියති  පුත් කුමරුවෙක්ව වස පොවා මරා දැමුවේ ය.[3] රටේ ව්‍යවුල් තත්ත්වය ගුණගරුක අදහස් පවසන සාහිත්‍යය කෘතීන් බිහිවීමට සාධකයක් වුණි. ඒහෙයින් සුභාෂිතය, දහම්සොඬකව ලෝවැඩ සඟරාව වැනි කෘතීන් බිහිවිය. සුභාෂිතය සමාජයේ පැවති බොහෝ වැරදි නිවැරදි කර ගැනීමට අවශ්‍ය මග පෙන්වා දුන්නේ ය. එක් ඒක් දේ පිළිබඳ සුභාෂිතය පවසන අදහස් එහි ඇති කව් පදවල පැතිරී තිබේ. සත්පුරුෂයන්, අසත්පුරුෂයන්, දැනුම, සාසනය හා අනෙකුත් බොහෝ දේ ගැන සුභාෂිය නොවිදිමත් ලෙස අදහස් ගැබ් කොටගෙන තිබේ. ඒවා අතුරින් යහපත් පාලකයකු සතුව තිබිය ගුණාංග පිළිබඳ මෙම පර්යේෂණ පත්‍රිකාව සාකච්ඡා කරයි.

---

[1] සිංහල සාහිත්‍යය - පිටු අංකය - 8
[2] ධම්මික ජයසිංහ -  58
[3] එදා හෙළ දිව  - පිටු අංකය - 210



ISBN 978-955-627-128-1

## 2. පර්යේෂණ ක්‍රමය

ආචාර්ය ඩබ්. වී ද තාබෲ සංස්කරණය කළ සුභාෂිත ග්‍රන්තය මෙම පර්යේෂණට ප්‍රථමික දත්තය ලෙස උපයෝගී කොට ගන්නා ලදී. ද්විත්තීක දත්ත ලෙස මෙම කෘතිය පිළිබඳ ලියවී ඇති රචනා හා කථිකාචාර්ය ධම්මික ජයසිංහ මහතා සමග කළ සාකච්ඡාව ද උපයෝගී කරගෙන ඇත. සුභාෂිතයේ ඇති සිව්පද එකසීය එකක් විස්තරාත්මක උපගමන ක්‍රමය අනුව විශ්ලේෂණය කොට නිගමනවලට එන ලදී.

## 3. සාකච්ඡාවන් හා නිගමනයන්

### 3.1 ජනයාගේ සිත නොරිදවා නීතියට අනුව බදු අයකර ගතයුතුය්

රාජ්‍යක හෝ රටක පැවත්මට බදු අයකර ගැනීම අනිවර්ය වේ. බදුවලින් රාජ්‍ය තන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය ගෙන යා හැකි ය. තවද රටේ කරමින් පවතින ව්‍යාපෘති දිගටම කරගෙන යාමටත් අලුත් ව්‍යාපෘති පටන්ගෙනීමටත් බදු අවශ්‍ය වේ. බදු අයකර ගැනීමේ දී පාලකයා රටේ ජනයාගේ ආර්ථික තත්වය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. රටේ ජනයාගේ ආර්ථිකයට හානියක් නොවන ආකාරයන් නීතියට අනුව බදු අයකරගත යුතුවේ. එවිට රටේ පුරවැසියෝ දිළිඳුන් නොවෙති. මී මැස්සෝ සෙමින් සෙමින් මල්වල රොන් ගන්නාක් මෙන් ජනයාට නොරිදවා බදු ගතයුතු වේ. එසේ කළ විට ජනයාට එය නොදැනනු ඇත. එසේ අය කරගත් බදු සේනාව ආරක්ෂා කර ගැනීමට යොදාගත යුතු බව සුභාෂිතය පවසය්. මහ පොළවින් වාෂ්ප වී අහසට යන වතුර වැස්සක් වී නැවත මහපොළව පෝෂණය කිරීමට පොළවට පාත් වේ. ඒ ආකාරයෙන්ම ජනයාගෙන් ගන්නා බදු මුදල ජනයා ආරක්ෂා කිරීමට යහපාලකයෝ යොදා ගනිත්. රජයක සේනාවකින් කරන රාජකාරිය නම් මහජනතාව ආරක්ෂා කිරීම වේ. මෙය සුභාෂිතයේ පහත ආකාරයෙන් සඳහන් වේ.

කුලුණින් ගුණින් නුවණින් පසිඳු හැම තැන
සුදනන් සෙවුන නිරිඳෝ ලෙව් සත රකින
දෙහිරුන් මලින් රොන් ගෙන යන මෙන් සෙමින
නියමින් අය ගනිති සත සිත නො තළමින

(සුභාෂිතය - 25)

පිරිවරසෙන් රකිනා පිණිස නිරතුරු
පෙරනියමින් නිරිඳෝ රැගනිති පඬුරු
සිය ගුණයෙන් වසිනා පිණිස දිය තුරු
සිය කිරණින් දෙරණත රස ගනිය හිරු

( සුභාෂිතය - 18)

### 3.2 ඔහු ජනයාගේ ප්‍රශ්නවලට ඉක්මන් හා සුදුසු විසඳුම් දෙන කෙනෙකු විය යුතුය

පාලකයා ජනයන් ප්‍රය කරන කෙනකු විය යුතු ය. ඔහුව දකින විට ජනයාගේ ඇතුලත හා පිටත ඇති දුක් දුරු වේ. සිය කම් කටළුවලට පාලකයා විසඳුමක් දෙවී යන විශ්වාසය ගොඩ නගන ආකාරයට පාලකයාගේ ක්‍රියා කලාපයන් හා හැසිරීම් තිබිය යුතු වේ. සූර්යා දකින විට ඝන අඳුර දුරු වී දහවල් කාලය ඇති වන්නා සේම පාලකයාව දකිණ විට ජනයාගේ දුක් දොම්නස්වලට විසඳුමක් ලැබිය යුතු බව සුභාෂිතය පවසය්. මෙයින් ඔහු ජනයාට හානියක් නොවන ආකාරයට තීන්දු තීරණ ගතයුතු බවත් ජනයාගේ ප්‍රශ්නවලට විගහින් විසඳුම් දිය යුතු බවත් සුභාෂිතය වක්‍රව හඟවය්.

දියනෙත උදාවන සිය කිරණින් මහරු
මෙදියත දිවා බිහි දුරු වෙය් ගන අඳුරු
සිරිමත රජතුමෙකු දුටු පමණින් සොඳුරු
ඇතුළත පිටත දිව රෑ හැරෙය දුකඳුරු

(සුභාෂිතය - 24)



ISBN 978-955-627-128-1

**3.3 ප්‍රමාණයට වඩා ධනය රැස් නොකර යුතුය**

ධනය මිනිසාගේ ජීවිතය සුගමුදිත කරන සම්පතක් වේ. ජීවත් වීමට, සමාජය ඉදිරියේ ගාම්භීරව සිටීමට, අවශ්‍ය දේ ලබා ගැනීමට හා තවත් බොහෝ දේ සඳහා ධනය අවශ්‍ය වේ. නමුත් ප්‍රමාණයට වඩා ධනය රැස් කිරීමෙන් බොහෝ විපත් සිදුවීමට ඇති ඉඩකඩ අසීමිතය. මේ හෙයින් සිය ජනයා ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් තරම් ධනය කීර්තියෙන් යුතු පාලකයෝ රැස් කරති. කුසට අවශ්‍ය ප්‍රමාණයට ආහර ගත යුතු ලෙසම ජනයාගේ ආරක්ෂාවට අවශ්‍යවන ප්‍රමාණයට අනුව ධනය රැස් කළ යුතුය.

අමයුත් රස අහර වත් වඩවන ඔදස
කුසගත් ගිනි නිවන පමණට බුදින ලෙස
තෙද කිත් පතළ නිරිඳෝ නොමඳ දන රැස
නොකෙරෙත් ලොව සතුන් මකිනා විතර මිස

(සුභාෂිතය - 26)

**3.4 නුවණින් යුතු අය විය යුතුය**

පාලකයෙකු යනු ජනයාගේ ආරක්ෂාව ඇතුළු බොහෝ වගකීම් සිය හිසේ දරා සිටින පුද්ගලයෙකු වේ. ඔහුගේ පාලන ප්‍රදේශය තුළ ජන කණ්ඩායම් අතර ගැටුම් ඇති විය හැක. ස්වාභාවික විපත් සිදු විය හැක. රටේ ජනයා අතර බෝවන රෝග ව්‍යාප්ත වීමට හැක. සතුරු පීඩා ඇති වීමට පුළුවන. මෙවන් විපත් ඇති නොවන ආකාරයට දූරදර්ශීව කටයුතු කිරීම හා මෙවන් විපත් ඇති වූ විට එයින් ඇතිවන හානිය අවම කර එය කළමණාකරනය කිරීමට පාලකයා දක්ෂයකු විය යුතු වේ. මෙය නිසි ආකාරයෙන් කළමණාකරනය කිරීමට ඔහුට නුවණ අවශ්‍ය වේ. මෙ හෙයින් පාලකයා නුවණැති කෙනකු විය යුතු වේ. එවන් පාලකයෙකු පාලනය කරන රට ආරක්ෂා වේ. ඔහු ජනයා ද ආරක්ෂා කරයි. තවද රටේ ඇති සම්පත් නිසි ආකාරයෙන් කළමණා කරනය කර ජනයාට බොහෝ සෙයින් ප්‍රයෝනවත් ව්‍යපෘතිවල යොදවයි. මේ හෙයින් එවන් රජෙකු ලැබූ සම්පත් ස්වර්ගයේ ඇති සම්පත්වලටත් වඩා වටින්නේ ය.

පැනසර නොවන නිරිඳුන් ලද රජ සැපත
ගොරතර නිරා දුකටත් වැඩියෙන් විපත
තිරසර නැණැති නරවර ලද එම සැපත
සුරපුර සැපතටත් සිය ගුණෙනි යහපත

(සුභාෂිතය - 27)

සමවත වැසි සුළඟ කෙත් වත් වැවෙන මෙන
ලොවසත රැකෙති නිසි රජ නැණැති මැති ගෙන
එමහන නල නලින් වන දහන වන මෙන
දුසිරත රජ තුමතිගෙන් නසිය හැම තැන

(සුභාෂිතය - 29)

**3.5 මධ්‍යස්ත විය යුතුය**

රටේ පාලකයා මධ්‍යස්ත කෙනෙකු විය යුතු වේ. විශේෂයෙන් ඔහු නීතිය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී මැද මාවත අනුගමනය කිරීම ඔහු යහපාලකයෙක් යැයි අවබොධ කර ගැනීමට ඇති ලක්ෂණයක් වේ. ඔහු මධ්‍යස්ත වීමෙන් සෑම ජනකොටසටම ඔවුන්ගේ අනුපාතය අනුව සම්පත් ද රැකියා අවස්ථා ද අනෙකුත් පොදු දේ ද බෙදී යයි. එසේ මධ්‍යස්ත නොවී යම් පාලකයෙක් රට පාලනය කරන්නේ නම් ඔහුට අනෙකුත් දේ නොව ඔහුගේම රටම ඔහුට අනතුරක් වේ.

නුවණිැත් තවුන් පහකොට දුදනන් සෙවන
නොමගත් සිත තුළෙහි ගුණ පොකුරඹ ලෙසින
මැදහත් නොව මසුරු ගුණයෙන් දව සරින
රජුටත් එරටත් අතුරක් නැත වෙනින

(සුභාෂිතය - 30)



ISBN 978-955-627-128-1

### 3.6 ජනයා සතුටින් සිටීම බලා සතුටු වන කෙනෙකු විය යුතුය

පාලකයාගේ අරමුණ ඔහුගේ යටත් වැසියන්ව සතුටින් තැබීම වේ. ජනයා සමෘද්ධිමත් වී සතුටින් සිටින විට එය දැක පාලකයා ද සතුටු විය යුතු ය. එසේ ජනයා සතුටින් සිටින අවස්ථාවේ දී පාලකයාට ද සතුටු විය නොහැකි නම් ඔහු ජනයා විනාශ විය යුතු යැයි පතන කෙනෙකු වේ. එවන් කෙනෙකුට ජනයාගේ සතුට රෞද්‍ර හැඟීම් ඇති කරයි. එලෙස සිතන පාලකයා යහ පාලකයෙකු නොවන්නේ ය. යහ පාලකයෙකු ජනයාගේ සතුට බලා සතුටුවන කෙනෙකු විය යුතුය. එය සුභාෂිතයේ ඍජුව නොව වක්‍රාකාරයෙන් පවසා තිබේ. කවියන්, යුද භටයන් හා කෙළියෙහි යෙදෙන ස්ත්‍රීන් "තෝ", "තා" යන වචන දෙඩුව ද එයට රජවරු අමනාප නොවේ යැයි සුභාෂිතයේ ඇත.

පබඳ පසිඳු කිවිඳු ද යුදෙහි සෙබළු        ද
පැහැද සුරති කෙළිනා වර වරඟන        ද
කිවද තො තා යන බස් පෙරදැරි        සුහද
වරද නොව අසත් නිරිඳෝ වඩමිනො        ද

(සුභාෂිතය - 57)

### 3.7 සත්පුරුෂයන්ගෙන් සිය කටයුතු ඉටුකර ගත යුතුය

පාලකයෙකුට ඉටු කර ගැනීමට බොහෝ කාර්ය භාර්යන් තිබේ. එම කාර්ය භාර්යන් පෞද්ගලික ඒවා ද රාජකාරියට අදාල ඒවා ද විය හැක. නමුත් ඔවුහු එම කාර්ය භාර්යන් සත්පුරුෂයන්ගෙන් ඉටුකර ගනිත්. එයට ධනවත් අය උපයෝගී නොකරගත්. මෙය ලෝහමය කණ්නාඩියෙන් මුහුණ බලනවා සේ වැන්න. සත්පුරුරුෂයන් නුවණැතිව යහපත් අරමුණු පෙරටු කරගෙන කාර්යන් කරන්නෝ ය. මේ හෙයින් රටටත් පාලකයාටත් යහපත උදා වේ.

මහත් දනවතුන් ඇතිව ද සුදන        ගෙන
ගනිත් තමන් කටයුතු නිරිඳෝ        නිතින
ඇතත් කෙළ ගණන් රුස් කළ දන        බනාමින
බලන් ලොහො දපන තල ගෙන තම        වුවන

( සුභාෂිතය - 68)

### 3.8 උත්තමයන්ට සැප සම්පත් දිය යුතුය

යහ පාලකයන් දුර්ජනයන් ආශ්‍රය කළ ද වතුරින් කිරි වෙන් කර බොන හංසයා මෙන් උත්තමයන් තෝරාගෙන ඔවුන්ට සම්පත් දෙන්නෝ ය. එය සර්පයාගේ උගුරේ ඇති මැණික ඔටුන්නේ පලඳනවා වැන්න. උත්තමයන් එසේ ලබාගත් සම්පත් යහපත් වැඩ කටයුතු සඳහා යොදාගන්නෝ ය. මේ හෙයින් උත්තමයන්ට සම්පත් දිය යුතු වේ.

විසුවත් දුදන සහ සුදහන් රැගෙන        සරු
නැනවත් රජතුමෝ ඔවුනට දෙති        ඉසුරු
විසයුත් ගොර උරග කට රැඳි මිණි        මහරු
සලසත් රුවන් කිරුළඟ රුවනට        සොඳුරු

( සුභාෂිතය - 77)

## 4. පර්යේෂණ සාරාංශය

සුභාෂිත පද්‍ය ග්‍රන්තය යහපත් පාලකයෙකු සතුව තිබිය යුතු ගුණාංගයන් විධිමත් නොවන ආකාරයට පවසන අතර රාජ්‍ය පාලනය පිළිබඳ න්‍යායන් හඳුන්වා දී ඇත.

## 5. REFERENCES

**ප්‍රාථමික දත්ත**

තාබෲ . වී, ද (2011), *සුභාෂිතය*, සුහද ප්‍රකාශකයෝ



ISBN 978-955-627-120-1

**ද්විතීක දත්ත**

කරුණාතිලක, ඩේවිඩ්, (2015), *එදා හෙළදිව* (රොබට් නොක්ස් විසින් ලියන ලද An Historical Relation the Island of ceylone කෘතියෙහි සිංහල අනුවාදය), සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, ඕල්කෝට් මාවත, කොළඹ 11.

ගොඩකුඹුර, (1999), *සිංහල සාහිත්‍යය*, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**සාකච්ඡා**

ජයසිංහ, ධම්මික, සිංහල අධ්‍යයන අංශය, රුහුණු විශ්ව විද්‍යාලය



ISBN 978-955-627-128-1